**කළුතර දිස්ත්‍රික්කය ගොවිජන සේවා කාරක සභා 20 - 2023**

---

1. **විගණන මතය**

1.1 කළුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 20 ක 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** කළුතර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 20 කට අදාලව නිකුත් කර තිබුණු විගණන වාර්තා 20 හි කාරක සභා 03 ක මතය ව්‍යාවනය කිරීමද, කාරක සභා 17 ක් සඳහා තත්ත්වාගණනය කළ මතයක්ද ප්‍රකාශ කර ඇති අතර, මතය ව්‍යාවනය කිරීම හා තත්ත්වාගණනය කළ මතය සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුලත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි සඳහන් අංක 99 සිට 139 දක්වා වූ වගන්ති ප්‍රකාරව, කාරක සභා 20 හි ම ගොවිජන බැංකු විසින් මූල්‍ය ප්‍රකාශන සමග මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයක් සකස් කර නොතිබුණු අතර, ගොවිජන සේවා කාරක සභා 20 හි ම මූල්‍ය ප්‍රකාශන සමග හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශයන් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව ලබාදුන් උපදෙස් අනුව සකස් කර ඇත. ඉදිරියේදී නිවැරදිව සකස් කර ඉදිරිපත් කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව සකස් කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ට අනුකූලව ප්‍රධාන මුදල් ප්‍රවාහ හඳුනාගෙන වර්ගීකරණය කිරීමකින් තොරව ගොවිජන බැංකු අංශයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශන මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී භාවිතා කල සියළු ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුල සටහන් කල යුතු වුවත්, කාරක සභා 10 ක හා ගොවිජන බැංකු 10 ක මූල්‍ය ප්‍රකාශනවල සියලුම ගිණුම් ප්‍රතිපත්ති සටහන් කර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදිව සටහන් කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ප්‍රතිපත්ති හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව ස්ථාවර වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමේදී පිරිවැය, සමුච්චිත ක්ෂය, ශුද්ධ අගය වෙන් වෙන් වශයෙන් දැක්විය යුතු වුවත්, කාරක සභා 02 ක ඒ අයුරින් දක්වා නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදිව සටහන් කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව සකස් කර ඉදිරිපත් කළ යුතුය. |

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන බැංකුව වෙත පරිගණක උපාංග මිලදී ගැනීම සඳහා කාරක සභා 13 ක් විසින් එකතුව රු.2,524,665 ක් 2023 වර්ෂයේදී ගෙවීම් කර තිබූ අතර, එම ගෙවීම් වටිනාකම සමුච්චිත අරමුදල් ගිණුමට හර කිරීම නිසා එම වටිනාකමින් සමුච්චිත අරමුදල සහ වත්කම් ගිණුමේ ශේෂය අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | දිස්ත්‍රික් කාර්යාල උපදෙස් අනුව ක්‍රියාකර ඇත. | වත්කම් ගිණුම හා සමුච්චිත අරමුදල් ගිණුම නිවැරදි කිරීමට ක්‍රියාකළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 17 ක ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතියේ 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී රු.85,000 ක් වූ උපචිත වියදම් 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණු අතර, 2022 වර්ෂයට අදාලව 2023 වර්ෂයේ ගෙවන ලද රු.85,000 ක වියදම සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2024 වර්ෂයේදී සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. | උපචිත වියදම් නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ඇ) | බණ්ඩාරගම ගොවිජන සේවා කාරක සභා මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබූ රු.1,247,688 ක් වූ කාර්යාල උපකරණ හා රු.43,092 කෘෂි උපකරණ ක්ෂය කිරීමේදී එක් එක් වත්කම් අයිතමයන් මිලදීගත් දිනය පදනම් කර ගැනීමෙන් තොරව ක්ෂය වටිනාකම ගණනය කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි. | වත්කම මිලදී ගත් දිනය පදනම් කරගෙන ක්ෂය වෙන්කිරීම් කළ යුතුය. |
| (ඈ) | ලිපිගොනු මගින් හෝ වෙනත් ආකාරයකින් සනාථ නොවූ කාරක සභා 13 ක එකතුව රු.5,593,058 ක් වූ වගකීම් සහ කාරක සභා 15 ක භෞතික පැවැත්මද නොමැති එකතුව රු.3,967,964 ක වත්කම් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් හා වගකීම් ලෙස ඇතුළත් කර තිබුණි. | ව්‍යාජ වත්කම් හා ව්‍යාජ වගකීම් ඉවත් කර ගිණුම්ගත කරමි. | විධිමත් පරිදි කටයුතු කර ශේෂයන් තහවුරු කර ගැනීමෙන් පසු මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතුය. |
| (ඉ) | කාරක සභා 06 කට අදාලව එකතුව රු.177,765 ක යල් පැනගිය බීජ, පැළ හා පොහොර තොගයක් සහ කාරක සභා 02 ක එකතුව රු.43,996 ක් වූ භෞතිකව සත්‍යාපනය නොවූ දක්නට නොලැබෙන තොගයක් ද සක්‍රීය තොග ලෙස 2023 දෙසැම්බර් | පිළිගනිමි. | යල් පැනගිය තොගය සහ භෞතිකව දක්නට නොමැති තොගය සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කර තොග |

| | | | |
|---|---|---|---|
| | 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ තොගය තුළ ඇතුලත් කර තිබුණි. | | ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ඊ) | 2023 වර්ෂයේ අක්කර බදු ආදායම ගිණුම්ගත කිරීමේදී කාරක සභා 02 ක එකතුව රු.67,302 ක් අඩුවෙන්ද තවත් කාරක සභා 11 ක එකතුව රු.287,988 ක් වැඩියෙන් ද ගිණුම්ගත කර තිබුණි. | සොයාබලා නිවැරදි කරමි. | වර්ෂයට අදාල නිවැරදි අක්කර බදු ආදායම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 1.3.3 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාරක සභා 11 ක ගිණුම් විෂයයන් 26 කට අදාළව මූල්‍ය ප්‍රකාශන හා අනුරූපී වාර්තා අතර, ශේෂයන් හි එකතුව රු.5,511,654 ක නොසැසඳීම් පැවතුණි. | 2024 ගිණුම් වාර්තාවල නිවැරදි කිරීමට කටයුතු කරමි. | විධිමත් පරිදි කටයුතු කර ගිණුම් හෝ අනුරූපි වාර්තා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.3.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජ'නල් වවුචර් පිළියෙල කිරීමකින් හා අනුමැතිය ලබා ගැනීමකින් තොරව ගොවිජන සේවා කාරක සභා 03 ක් විසින් ජ'නල් සටහන් 103 ක් සහ ගොවිජන බැංකුවක ජ'නල් සටහනක් යොදා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. | 2024 වර්ෂයේදී ජ'නල් වවුචර් පිළියෙල කර අනුමැතිය ලබාගෙන ගිණුම්ගත කරමි. | උපකාර ලේඛන සහිතව ජ'නල් වවුචර් සකස් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසු ජ'නලයේ සටහන් යෙදිය යුතුය. |

### 1.3.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 15 ක එකතු වටිනාකම රු.28,841,480 කට අදාලව කොටස් ලේඛන , තැන්පත් ලේඛන සහ චෙක්පත් ලේඛන, බැංකු සැසඳුම් වාර්තා, කුඩා කණ්ඩායම් තැන්පත් ලේඛන, ස්ථාවර වත්කම් ලේඛන, ණය ශේෂ ලේඛන සහ ශේෂ සනාථන සහතික වැනි ලිඛිත සාක්ෂි නොතිබීම හේතුවෙන් එම ගිණුම් විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | අදාළ උපලේඛණ සහ ලිඛිත සනාථන සාක්ෂි 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | පිළිතුරු ප්‍රකාරව 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග අදාල ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ඉත්තෑපාන ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආදායමක් ලෙස සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් ලැබීමක් ලෙස සටහන් කර තිබූ රු.78,331 ක පොලී ආදායම් ශේෂය තහවුරු කිරීමට ලිඛිත සාක්ෂි නොපැවතුණි. | සොයා බලා නිවැරදි කරමි. | විගණන සාක්ෂි හඳුනාගෙන 2024 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාල පරිදි නිවැරදි කළ යුතුය. |

## 1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත | | | |
| (i) 30 වගන්තිය | කාරක සභා 03 ක වගා කළ හැකිව තිබූ අක්කර 804 රූඩ් 79 පර්චස් 12 ක වපසරියක් සහිත කුඹුරු ප්‍රමාණයක් පුරන්ව පැවතුණි. | පිළිගනිමි. | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |
| (ii) 56 වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 20 ක් මගින් නීත්‍යානුකූලව අයකර ගත යුතු සියළුම අක්කර බදු මුදල් නියමිත පරිදි අයකර ගෙන නොතිබුණි. | පිළිගනිමි. | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |
| (iiii)75 වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 02 ක බල ප්‍රදේශවල ජීවත්වන ගොවි පවුල් 15,336 ක් වන නමුත් පනතේ විධිවිධාන ප්‍රකාරව එම පවුල් වෙත ගොවි හැඳුනුම්පත් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |
| (ආ) 2012 පෙබරවාරි 29 දිනැති 4/2012 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 5.6(1) ඡේදය | ගොවිජන බැංකුවට අදාළ සියලුම ගිණුම් ගොවිජන සේවා කාරක සභාවේ වාර්ෂික අවසන් ගිණුම්වලට ඇතුළත් කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 20ම එසේ කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ඇ) ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 110 | බුලත්සිංහල ගොවිජන සේවා කාරක සභාව විසින් හානි හා පාඩු සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන යා යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) මුදල් රෙගුලාසි 141(2) 386(3) | බුලත්සිංහල ගොවිජන සේවා කාරක සභාව මගින් එකතුව රු.3,218,381 ක චෙක්පත් උපපත්‍රිකා 17 ක් සඳහා චෙක්පත් අත්සන් කරන නිලධාරී විසින් කෙටි අත්සන හා වවුචර් අංකය සඳහන් කර නොතිබුණි. | පිළිගනිමි. | - එම - |
| (iii) මුදල් රෙගුලාසි 215(1) | කිසියම් සැපයුමකට අදාල සියළු කටයුතු අවසන් කිරීමෙන් තොරව පූර්ව ගෙවීම් නොකළ යුතු වුවත්, කාරක සභා 14 ක භාවිතය වෙනුවෙන් පරිගණක උපාංග මිලදී ගැනීම වෙනුවෙන් රු.3,653,508 ක මුදලක් 2023 වර්ෂයේ ගෙවීම් කර තිබුණු අතර, 2024 ජූලි මාසය වන විටත් අදාල සියළුම භාණ්ඩ කාරක සභාව වෙත ලැබී නොතිබුණි. | පිළිගනිමි. | - එම - |
| (iv) මුදල් රෙගුලාසි 237 (ඇ) | එකතුව රු.2,679,736 ක් වූ මිලදී ගැනීම් 39 ක් වෙනුවෙන් කාරක සභා 03 ක් විසින් තොග පොත්/ පාරිභෝජන ලේඛන ඉන්වෙන්ට්‍රි ලේඛනවලට යොමු දැක්වීම හා තොග භෞතිකව ලැබීමට පෙර ගෙවීම් කර තිබුණි. | පිළිගනිමි. | - එම - |
| (v) මුදල් රෙගුලාසි 245(1) | බදුරලිය ගොවිජන සේවා කාරක සභාව විසින් එකතු වටිනාකම රු.14,495,954 ක් වූ ගෙවීම් වවුචර් පත් 12 ක් සඳහා අනුමත කිරීම හෝ සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. | පිළිගනිමි. | - එම - |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2023 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 13 ක එකතුව රු.7,343,884 ක අතිරික්තයක් හා කාරක සභා 07 ක එකතුව රු.3,453,094 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය හා ඌනතාවය පිළිවෙලින් රු.4,375,045 ක් හා රු.1,784,442 ක් විය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල අනුව ගොවිජන බැංකු 19 ක එකතුව රු.3,995,924 ක අතිරික්තයක් හා එක් ගොවි බැංකුවක රු.274,769 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය හා ඌනතාවය පිළිවෙලින් රු.3,047,933 ක් හා රු.143,137 ක් විය

### 2.2 මූල්‍ය ප්‍රතිඵල විශ්ලේෂණය

(අ) කාරක සභා 06 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලවල එකතු වටිනාකම රු.6,337,506 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව එම කාරක සභා 06 හි ඉකුත් වර්ෂයේ අතිරික්තයේ එකතු

වටිනාකම රු.2,384,881 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයන් හි රු.3,952,625 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයන්ට අක්කර බදු ආදායම් වැඩි වීම, ස්ථාවර තැන්පත් පොලී ආදායම් වැඩිවීම, අලෙවිහල් ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ආ) කාරක සභා 02 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයෙහි එකතු වටිනාකම රු.238,482 ක අතිරික්තයක් වුවත්, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවයේ එකතු වටිනාකම රු.149,140 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලන්හි රු.387,622 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයන්ට අක්කර බදු ආදායම් වැඩිවීම, පොහොර ආදායම් වැඩිවීම, අලුත්වැඩියා වියදම් අඩුවීම, ගාස්තු ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ඇ) කාරක සභා 04 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලවල එකතු වටිනාකම රු.440,303 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තයේ එකතු වටිනාකම රු.493,019 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයන්හි රු.933,322 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පස් අලෙවි ආදායම් අඩුවීම, ට්‍රැක්ටර් අලුත්වැඩියා වියදම් වැඩිවීම, ලිපිද්‍රව්‍ය වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ඈ) කාරක සභා 03 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලවල එකතු වටිනාකම රු.3,012,791 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවයේ එකතු වටිනාකම රු.1,635,302 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයන්හි රු.1,377,189 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අක්කර බදු ආදායම් අඩුවීම, අලෙවි ආදායම් අඩුවීම, පොහොර ආදායම් අඩුවීම හා වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ඉ) කාරක සභා 05 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵල එකතු වටිනාකම රු.767,896 ක අතිරික්තයක් පෙන්නුම් කළ අතර, ඊට අනුරූපීව එම කාරක සභා 05 හි ඉකුත් වර්ෂයේ අතිරික්තය එකතු වටිනාකම රු.1,497,145 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයන්හි රු.729,249 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අලෙවි ආදායම් අඩුවීමත් වියදම් වැඩිවීමත් හේතුවී තිබුණි.

(ඊ) ගොවිජන බැංකු 19 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵල එකතුව රු.3,995,924 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයෙහි අතිරික්තයේ එකතු වටිනාකම රු.3,047,933 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.947,991 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඒ සඳහා සක්‍රීයව ගොවීන් වෙත ණය ලබාදීම සහ වියදම් අවම වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. එහෙත් 2023 වර්ෂයේදී පාඩාගොඩ ගොවිජන බැංකුව පමණක් රු.274,769 ක ඌනතාවයක් ලබා තිබූ අතර ඊට අනුරූපීව පෙර වර්ෂයේ අතිරික්තය රු.143,137 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.417,906 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඒ සඳහා ගොවිජන බැංකුවේ ආදයම් අඩුවීම සහ දරන ලද වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණය අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 20 හි 2023 වර්ෂය තුල 'w ' කාණ්ඩයේ වී වගා කරන කුඹුරු හෙක්ටයාර 21,119 ක වී වගා කිරීමට සැලසුම් කර තිබුණද, හෙක්ටයාර 15,679 ක් පමණක් වී වගා කිරීම නිසා හෙක්ටයාර් 5440 කින් ඉලක්කය ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණි. | ඉදිරියේදී වී වගාව වැඩිදියුණු කිරීමට කටයුතු කරමි. | වගා ඉලක්ක ඉහළ නැංවීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට එක් ගොවිජන සේවා කාරක සභාවක තැන්පත් ගිණුම් කුඩා කණ්ඩායම් තැන්පත්, කාන්තා ගොවි සංවිධාන තැන්පත් හා පෙරමග ළමා තැන්පත් ගිණුම් 3576 කින් ගිණුම් 2182 ක් එනම්, සියයට 61 ක් වසර 02 කට වැඩි කාලයක් තුල ගනුදෙනු සිදුනොකර අක්‍රීය ගිණුම් බවට පත් වී තිබුණි. | සොයාබලා ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීමට කටයුතු කරමි. | පිළිතුරු ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2023 වර්ෂය තුල ගොවිජන බැංකු 16 ක සිතමු කාන්තා වැඩසටහන් 363 ක් ක්‍රියාත්මක කර තිබූ අතර, ඒ අතරින් වැඩ සටහන් 174 ක ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොපැවතුණි. | සොයා බලා 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | පිළිතුරු ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | වර්ෂය තුල ගොවිජන සේවා කාරක සභා 20 හි පුරන් කුඹුරු අක්කර 2268 ක වී වගා කිරීමට ඉලක්ක කර තිබුණද, වසර අවසාන වන විට අක්කර 1331 ක පුරන් කුඹුරු අස්වැද්දීමට ක්‍රියාකර නොතිබුණි. | පුරන් කුඹුරු ඉලක්ක 2024 වර්ෂයේදී ළඟා කර ගැනීමට කටයුතු කරමි. | පුරන් කුඹුරුවල වී වගාව වැඩි දියුණු කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඉ) | කාරක සභා 11 ක් පවත්වාගෙන යන ඉඩම්වල අයිතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් පවරා ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | පවරා ගැනීමට ක්‍රියා කරමින් පවතී. | ඉඩම් පවරා ගැනීමට ක්‍රියා කළ යුුතුය. |

**3.2 අරමුදල් ඌන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉංගිරිය කාරක සභාවේ සංවර්ධන කටයුතු සඳහා ලැබී රු.209,420 ක මුදලක් ඵලදායී කාර්යයක් වෙනුවෙන් යොදා නොගෙන නිෂ්කාර්යව ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණි. | 2024 වර්ෂයේදී ආයෝජනය කිරීමට කටයුතු කරමි. | සංවර්ධන කටයුතුවල යෙදවීම හෝ විධිමත් අනුමැතියක් ලබාගෙන ස්ථාවර තැන්පතුවක ආයෝජනය කළ යුතුය. |
| (ආ) | පානදුර කාරක සභාවේ හෙල බොජුන්හල ගොඩනැගිල්ල සහ බාහිර අලෙවිසැල බාහිර පාර්ශවයකට කුලී පදනම මත ලබාදීමේදී ලබාගත් එකතු වටිනාකම රු.106,500 ක අත්තිකාරම් මුදල් කෙටි කාලීනව ආයෝජනය නොකර බැංකු ජංගම ගිණුමක රඳවාගෙන තිබුණි. | ස්ථාවර ගිණුමක තැන්පත් කිරීමට කටයුතු කරමි. | ජංගම ගිණුමක පවතින මෙම මුදල් ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | පැලවත්ත කාරක සභාව සතුව 2023 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.1.682,067 ක් වූ ජංගම ගිණුමේ ශේෂය පොලී ආදායමක් ලැබෙන පරිදි ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබාගෙන ආයෝජනය කරමි. | ජංගම ගිණුමක පවතින මෙම මුදල් ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) බණ්ඩාරගම කාරක සභාව සතුව පවතින ජංගම ගිණුම් 02 ක සහ ඉතිරි කිරීමේ ගිණුමක වසර 2 ක සිට ඉදිරියට එන සමාලෝචිත වර්ෂය අවසානයට එකතු වටිනාකම රු.1,315,229 ක ශේෂයක් පැවති අතර, එම මුදල් ඉහළ පොලී අනුපාතයක් යටතේ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමට පියවර ගෙන නොතිබුණි. | පිළිගනිමි. | මෙම මුදල් වැඩි ප්‍රතිලාභ සහිත ආයෝජන මාර්ගයක යෙදවීමට ක්‍රියාකළ යුතුය. |
| (ඉ) බදුරලිය කාරක සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට එකතු වටනාකම රු.139,316 ක් වූ බැංකු ඉතිරි කිරීම් ගිණුම් 02 ක ශේෂයන් වැඩි පොලී ප්‍රතිශතයක් හිමිවන ස්ථාවර තැන්පතු ගිණුම්වල අයෝජනය කිරීමකින් තොරව ඉතිරි කිරීමේ ගිණුම්වලම තැන්පත් කර තිබුණි | පිළිගනිමි. | මෙම මුදල් වැඩි ප්‍රතිලාභ සහිත ආයෝජන මාර්ගයක යෙදවීමට ක්‍රියාකළ යුතුය. |
| (ඊ) මිල්ලනිය ගොවිජන සේවා කාරක සභාවේ එකතු වටිනාකම රු.1,875,166 ක් වූ විවිධ කාර්යයන් වෙනුවෙන් කාරක සභාවේ තැන්පත් කර ඇති ආපසු ගෙවිය යුතු ඇප හා ගාස්තු අදාල තැන්පත්කරුවන්ට ලබාදිය යුතු අවස්ථාවන් හිදී ලබාදිය හැකි වන පරිදි සහ කාරක සභාව වෙත ආදායමක් ලැබිය හැකි වන පරිදි ස්ථාවර තැන්පතුවල, ආයෝජනය කිරීමකින් තොරව, මධ්‍යස්ථානයේ බැංකු ජංගම ගිණුමේ රඳවාගෙන තිබීම හේතුවෙන් උපයාගත හැකිව තිබූ පොලී ආදායමක් අහිමි වි තිබුණි. | ඉදිරියේදී ආයෝජනය කිරීමට කටයුතු කරමි. | මෙම මුදල් වැඩි ප්‍රතිලාභ සහිත ආයෝජන මාර්ගයක යෙදවීමට ක්‍රියාකළ යුතුය. |
| (උ) 2023 දෙසැම්බර් 31 දිනට රු.465,038 ක එකතු වටිනාකමක් ඇති මුදල් ශේෂයක් ඉත්තෑපාන ගොවිජන සේවා කාරක සභාව මගින් ඉතිරි කිරීම් ගිණුම් 02 ක සහ ජංගම ගිණුමක් පවත්වාගෙන ගොස් තිබූ අතර, මෙම බැංකු ගිණුම් ගනුදෙනු සඳහා සමාලෝචිත වර්ෂය තුල භාවිතා කර නොතිබුණි. මෙම මුදල් ඵලදායී කාර්යයක් වෙනුවෙන් යොදාගන්නා තුරු වැඩි පොලී ප්‍රතිශතයක් ලබාගත හැකි ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමට ක්‍රියාකර නොතිබුණි. | එම මුදල් ප්‍රතිලාභ වැඩි ආයෝජන මාර්ගයක යෙදවීමට කටයුතු කරමි. | මෙම මුදල් ඵලදායී ආයෝජන මාර්ගයක යෙදවීමට ක්‍රියාකළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් 2006 වර්ෂයේදී කාරක සභා 02 ක් සඳහා ලැබී තිබුණු අත්ට්‍රැක්ටර් 02 ක් විගණිත 2024 වර්ෂය වන විට ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතුණ අතර, අවශ්‍ය නඩත්තු කටයුතු සිදුකර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කාරක සභා ක්‍රියාකර නොතිබුණි. | එකඟ වෙමි. ඉදිරියේදී භාවිතයට යොදාගනිමි. | ඵලදායී කාර්යයක් සඳහා යොදා ගැනීම හෝ විධිමත් පරිදි අපහරණය කළ යුතුය. |
| (ආ) | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් කාරක සභාවක් වෙත ලබා දී තිබූ සේප්පුවක් වසර 10 කට වඩා වැඩිකාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණු අතර අදාල සේප්පුවේ වටිනාකම පිළිබඳ තොරතුරු ලබාගෙන ගිණුම්ගත කිරීමට හා බඩු වට්ටෝරු පොත්වල ඇතුලත් කිරීමටද කටයුතු කර නොතිබුණි. | විවෘත කිරීමට නොහැකි අතර, ඒ සඳහා උපදෙස් ඉල්ලා ඇත. | සේප්පුව භාවිතයට ගැනීමත්, වට්ටෝරු පොත්වලට ඇතුළත් කිරීම හා වටිනාකම ගිණුම්ගත කිරීම කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව එකතු වටිනාකම රු.1,506,720 ක් වැයකර කනන්විල කාරක සභා භූමි තුල හෙල බොජුන් හල නමින් ආපන ශාලාවක් ඉදිකර තිබුණ අතර, දිගු කාලයක සිට ඵලදායී කාර්යයකට භාවිතා නොකර ඌන උපයෝජිතව පැවතුණි. | පිළිගනිමි. 2024 සිට ඵලදායී කාර්යයකට භාවිතා කරමි. | මෙම ආපනශාලා ඵලදායී කාර්යයකට භාවිතා කළ යුතුය. |
| (ඈ) | පමුණුගම කාරක සභා භූමිය තුල මිරිදිය මසුන් වගාකිරීම සඳහා ඉදිකළ ජල ටැංකි ඵලදායී කාර්යයකට භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. | පිළිගනිමි. | මෙම ජල ටැංකි ඵලදායී කාර්යයකට භාවිතා කළ යුතුය. |
| (ඉ) | බණ්ඩාරගම කාරක සභාව සතුව පවතින අත් ට්‍රැක්ටරය 2022, 2023 වර්ෂවල හා 2024 ජූලි මස දක්වා ඵලදායී කාර්යයකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | පිළිගනිමි. | මෙම ට්‍රැක්ටරය ඵලදායී කාර්යයක් සඳහා භාවිතා කළ යුතුය. |
| (ඊ) | මදුරාවල මධ්‍යස්ථානයේ පොහොර ගබඩාව ඉදිකර තිබූ ගොඩනැගිල්ල පිවිසුමේ පඩිපෙලක් ඉදිකර තිබීම නිසා පොහොර ගබඩාව තුලට පොහොර තොග ගෙන ඒමට අපහසු වීම හේතුවෙන් පොහොර ගබඩා කිරීමට භාවිතා නොකර වෙනත් අබලි ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා භාවිතා කර තිබුණු අතර, වසර 06 කට ආසන්න කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි. | මෙම පඩිපෙළ නිසා පොහොර බෑමට සහ පැටවීමට අපහසුතා පවතී. දියර පොහොර හා පැරණි පොත්පත් හා ලිපිද්‍රව්‍ය තැන්පත් කර ඇත. | විධිමත් පරිදි වෙනස්කම් සිදු කර ගොඩනැගිල්ල සැලසුම් කළ කාර්ය සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාරක සභා 19 කට අදාලව කෘ.ප.නි.ස. වසම් 548 ක් පැවති අතර, අදාල වසම් සඳහා අනුයුක්ත කළ නිලධාරීන් සංඛ්‍යාව 403 ක් වීම හේතුවෙන් වසම් 140 ක් වැඩබලන නිලධාරීන් යටතේ පැවතුණි. | සේවක ඌනතාවය මත වැඩබැලීමට සිදුව ඇත. | වසම්වල ගොවි ජනතාව වෙත සේවය කාර්යක්ෂමව ලබා දීම සඳහා පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාරක සභා 16 ක 2023 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණ ද එම සැලැස්ම නැවත 2023 දෙසැම්බර් 31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය ඉලක්ක සමග සන්සන්දනාත්මකව පරීක්ෂා කළ හැකි පරිදි හා මධ්‍යස්ථානයේ සියළු ක්‍රියාකාරකම් ඇතුලත්ව ඉලක්ක ගත ආදායම් හා වියදම් වර්ෂ අවසානයේ සත්‍ය ක්‍රියාකාරකම් සමග පරීක්ෂා කළ හැකි පරිදි එම සැලසුම් සකස් කර නොතිබුණි. | 2024 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉදිරි වර්ෂයේ සැලැස්ම පෙර වර්ෂයේදී නියමිත දිනට සකස් කර ලිඛිත අනුමැතිය ලබා ගැනීම හා ප්‍රගති වාර්තා සකස් කිරීම කළ යුතුය. |

## 5. ගොවිජන බැංකු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගොවිජන බැංකු 17 ක් මගින් ගොවීන් 296 දෙනෙකු වෙත ලබා දී තිබූ එකතුව රු.6,667,282 ක ණය හා පොලී මුදල් අය නොවීම නිසා විනිශ්චය සභා වෙත යොමු කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,136,015 ක මුදලක් පමණක් අයකර ගැනීමට හැකිවීම නිසා එදිනට රු.5,531,267 ක් අයකර ගැනීම නොහැකිවී පැවතුණි. නමුත් දිගු කාලයක සිට අයකර ගැනීමට නොහැකිව පැවති මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට ද කටයුතු කර නොතිබුණි. | මෙම හිඟ ණය අයකර ගැනීමට භෞතික ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 20 ක ගොවිජන බැංකු නියමු ව්‍යාපෘති මගින් 2023 වර්ෂය තුල එකතුව රු.94,336,050 ක් ගොවීන් 1619 දෙනෙකු වෙත විවිධ ණය මුදල් ලෙස ලබාදී තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට විවිධ ණය වර්ග යටතේ ගොවීන් 3171 දෙනෙකු වෙත ලබදුන් එකතුව රු.121,122,391 ක ණය මුදලක් ලැබිය යුතුව පැවතුණු අතර, එම මුදලින් ගොවිජන බැංකු 16 ක වසර 05 ඉක්ම වූ රු.5,594,941 ක ණය ශේෂයක් පැවතුණි. | මෙම පැරණි හිඟ ණය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | වර්ෂ 5 කටත් වඩා පැරණි මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට භෞතික ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | සීමාසහිත හොරණ (ජනතා) ගොවි සමාගම වෙත 2000 වර්ෂයේදී ලබාදී තිබූ ගොවි සමාගම් "හිඟ ණය" මුදල වන එකතුව රු.854,900 ක මුදල වර්ෂ 22 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණ ද, එම ණය අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි | මෙම පැරණි ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | මෙම පැරණි හිඟ ණය ශේෂය අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |